# නත්තල් තෑග්ග



වෙනුලි නෙතුම්සා හරස්ගම

# නත්තල් තෑග්ග

චෙනුලි නෙතුම්සා හරස්ගම

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : | 2023 |
| කර්තෘ | : | වෙනුලි නෙතුම්සා හරස්ගම |
| ලිපිනය | : | නො,44,<br>කෙලින් වීදිය,<br>තලාතුඔය. |
| ISBN අංකය | : | 978-624-206-929-6 |

මුද්‍රණය
"PRESS"
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

දැනුමෙන් පෝෂණය කරන්නට වෙර
දරන,
මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,
පන්තිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,
මා පෝෂණය කරන, ඇතිදැඩි කරන
මාගේ මව්නි, පියාණෙනි ඔබ
දෙපලටත්,
මා වැනිම දැනුම හඹා යන
මාගේ සොයුරු කැළටත්
මේ පොත ආදරයෙන් පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර  
විදුහල්පතිනිය  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර  
2023-01-01

නෙතුයි මිතුයි හොඳම යාළුවෝ දෙන්නෙක්

මේ දෙන්නම ඉන්නේ එකම ගමේ

මේ දෙන්නම ගියේ එකම ඉස්කෝලෙට




නෙතුගේ අම්මායි තාත්තායි රස්සාවල් කරනවා. මිතුගේ අම්මායි තාත්තායි කරේ වෙන අයගේ කුඹුරු කොටලා දෙනවා. එළවලු කොටුවල වැඩ එහෙම කරලා දෙන එක.



සමහර දවස් වලට මිතුගේ අම්මාටයි තාත්තාටයි වැඩ නෑ. ඒ දවස් වලට ඒ දෙන්නා මිතුට විතරක් ගෙදර තියෙන දෙයක් උයලා දීලා ඒ දෙන්නා බඩගින්නේ ඉන්නවා.



නෙතුට එහෙම නෑ. එයා කැමති හැම දෙම එයාගේ අම්මායි තාත්තායි ගෙනල්ලා දෙනවා. නෙතු මිතුට උදවු කරනවාට එයාගේ අම්මායි තාත්තායි කැමති.



නෙතුයි මිතුයි හිටියේ එකම පංතියේ නිසා නෙතු මිතුට උදවු කරනවා. නෙතු ගෙන කෑම එක, පැන්සල් මිතුට නැත්නම් නෙතු දෙනවා. පාඩම් තෙරුනේ නැත්නම් කියලා දෙනවා.



මිතු ඉස්කෝලේ ගෙන බෑග් එක හොඳටම ඉරිලා. වැස්ස දවසට බෑග් එක ඉරිලා නිසා පොතුත් තෙමෙනවා. මිතු එයාගේ අම්මාට කියලා ඉරුණ ගොඩක් තැන් මහගෙන තමා ඉස්කෝලේට ගෙන්නේ.



සමහර ළමයි එයාට ඒ නිසා විහිළු කරනවා. එතකොට මිතුට දුක හිතිලා අඬනවා. ‘බලන්නකෝ නෙතු මම දුප්පත් නිසා ළමයි මට කියන දේවල්.’ කියලා අඬනවා.



එක දවසක් උදේ ඉස්කෝලේ එනකොට නෙතුගේ සපත්තු දෙක හොඳටම කැඩිලා. ඒ සපත්තු දෙක පාවිච්චි කරන්න බැරි තරමටම දිරලා. එදා එයා සපත්තු නැතුව ඉස්කෝලේ හිටියේ.




පහුවදා එයා ඉස්කෝලේ ආවේ සෙරප්පු දාගෙන. එදත් වෙනදා වගේම ළමයි එයාට විහිළු කළා. නෙතු එදත් හොඳටම ඇඬුවා.



නෙතුට එදා හරිම දුක දවසක්. එයා ගෙදර ගිහින් අම්මාට වෙච්ච හැම දෙයම කිව්වා. නෙතුගේ අම්මා කිව්වා

“දුව නෙතු ලබන සතියේ නත්තල්. අපි මිතුට නත්තල් තෑග්ගක් දෙමු.”



නෙතුට හරිම සතුටුයි. එයා ඇඟිලි ගැන ගැන අම්මාට කිව්ව නත්තල් දවස එනකල් බලන් හිටියා.

එදා නිවාඩු දවසක්. නෙතු එයාගේ අම්මායි තාත්තායි එක්ක ටවුමට ගියා. මිතුට තෑගි ගන්න.



නෙතු මිතුට ලස්සන බෑග් එකකුයි, සුදුම සුදු සපත්තු දෙකකුයි, පොත් ටිකකුයි, පැන්සල්, ඉරේසර් ගත්තා.

එයාගේ අම්මායි තාත්තායි මිතුගේ ගෙදරට අවශ්‍ය කරන බඩු ටිකකුත් ගත්තා.



ගෙදර ඇවිත් නෙතු එයාගේ අම්මා එක්ක තෑග්ග ලස්සනට එතුවා.

ඔන්න නත්තල් දවස ආවා.

නෙතු අම්මායි තාත්තායි එක්ක මිතුලාගේ ගෙදර ගියා.



මිතුට නෙතු දැකලා පුදුම හිතුනා. එයා දන්නේ නෑ නෙතු එනකල්ම.

“මිතු මෙන්න ඔයාට මගෙන් නත්තල් තෑග්ගක්.”

නෙතු මිතුට තෑග්ග දුන්නා.



"නෙතු ඔයාට ගොඩක් ස්තූතියි."

මිතු නෙතුට කිව්වා.

මිතු නෙතුගේ අම්මාටයි තාත්තාටයි වැන්දා.

නෙතුත් මිතුගේ අම්මාටයි තාත්තාටයි වැඳලා

එන්න පිටත් වුණා.



නෙතුගේ අම්මාටයි තාත්තාටයි තමන්ගේ දුව ගැන හරිම ආඩම්බරයි.

පොඩි කාලේදීම අනුන්ට උදවු කරන්න පුරුදු වෙන එක බොහෝම හොඳ පුරුද්දක්.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුර අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01